## 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය තුල යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිලදී ගැනීම් වටිනාකම රු.51,301,152 ක් වුවද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එම වත්කම්වල මිලදී ගැනීම් වටිනාකම රු.37,826,537ක් වූ බැවින් එකතුව රු.13,474,615 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ වියදමක් ලෙස හදුනාගෙන ඇතත් අදාල භාණ්ඩ ලැබී ඇත්තේ 2022 වර්ෂයේ වන බැවින් එය 2021 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වත්කමක් ලෙස හදුනාගෙන නැති බැවින් මෙම තත්ත්වය වාර්තා වී ඇත.එම වෙනස සිගාස් වැඩ සටහනට දත්ත ඇතුලත් කිරීමේදී සිදුවී ඇති අතපසුවීමක් වන බැවින් එය නිවැරදි කිරීමට උපදෙස් ලබාදී ඇත. | වත්කම් කළමණාකරණය විධිමත් කිරීම |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 07 ඡේදය ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුව විසින් අර්ධ වාර්ෂික ආදායම් වාර්තා අදාල කාල සීමාව අවසන් වූ දින සිට දින 15 ක් ඇතුලත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේතුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය මුදල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත මෙම වාර්තාවේ පිටපතක් යැවීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | ආදායම් වාර්තා නිවැරදිව අදාළ අංශ වෙත ඉදිරිපත් කිරීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 491 ප්‍රකාරව ප්‍රතිග්‍රාහක කාර්යයක් නොවන සෑම දෙපාර්තමේන්තුවක් නොහොත් කාර්යාලයක් විසින්ම ලෙටර් එච් පෝර්මයේ මාසික ප්‍රකාශයක් පිළියෙල කොට ඒ ප්‍රකාශය ලැබිය යුතු මාසය එක්කම ඊළඟ මාසයේ 15 හෝ ඊට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ශාඛා කාර්යාල 70 ක් සහිත මෙම දෙපර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේදී වාර්තා 840 ක් | මු.රෙ. 491 ප්‍රකාරව 'ලෙටර් එච්' පෝරමයේ මාසික ප්‍රකාශන ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | අදාළ වාර්තා විගණකාධිපති වෙත නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | විගණනයට ලබාදිය යුතු වුවද වාර්තා 61 ක් පමණක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. | | |
| (ඇ) | ශාඛා කාර්යාල වලින් ලැබිය යුතු මාසික ආදායම් වර්ගීකරණ වාර්තා 840 න් වාර්තා 213 ක් පමණක් විගණනයට ලබා දුන් බැවින් 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් රැස් කල ලියාපදිංචිකිරීමේ ගාස්තු ආදායම නිවැරදි බවට තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය. | අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් නියමිත දිනට මෙම වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා මෙම තත්ත්වය වාර්තා වී ඇත. | අදාළ වාර්තා විගණකාධිපති වෙත නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුවීම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 128 (2) ඇ ප්‍රකාරව තමා වගකීමට බැඳී සිටින විවිධ ආදායම් ශීර්ෂ උප ශීර්ෂ විෂයයන් හා උප විෂයයන් යටතේ එක් එක් මුදල් වර්ෂයේ ජුනි 30 වැනි දිනට හා දෙසැම්බර් 31 වැනි දිනට හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ තත්වය පෙන්නුම් කෙරෙන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණකාධිපති වෙත මෙම වාර්තා ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | යොමුගත රෙගුලාසියට අනුකූල විය යුතු වීම. |
| (ඉ) | 2021 මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය ආරම්භයේ හිඟ ආදායම් වටිනාකම රු.26,723,078 ක් වුවද දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් වාර්තා අනුව මෙම අගය රු.13,921,038 ක් වූ බැවින් වර්ෂය ආරම්භයේ හිඟ ආදායම් වටිනාකමේ රු.12,802,040 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව වර්ෂය අවසානයේ හිඟ ආදායම් වටිනාකම ද එම අගයෙන් වෙනස් වී තිබුණි. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් වැරදි පදනමක් යටතේ මෙම දෙපාර්තමේන්තුවට අයත් නොවන ආදායම් (හිග ආදායම්) වාර්තා කිරීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. | නිවැරදි වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතුවීම. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් අමාත්‍යාංශය විසින් හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන වෙනුවෙන් ලබාදුන් ප්‍රතිපාදන කුමන කාර්යයන් සඳහා යොදාගනු ලබන්නේද යන්න ඇතුළත්ව සකස් කළ විස්තරාත්මක සැළැස්මක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර එම ප්‍රතිපාදන වලින් හිමිකම් ලියාපදිංචිකිරීමේ කාර්යාල වල රු.31,244 ක දුරකථන වියදම් ගෙවීම් කර වැය විෂය අංක 2509 යටතේ ගිණුම් ගත කර තිබුණි. | ඉඩම් අමාත්‍යාංශය විසින් මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා 116-2-6-10-2509 යටතේ ප්‍රතිපාදන ලබා දෙන අතර එම ප්‍රතිපාදන මඟින් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වල පවත්වාගෙන යන හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල වියදම දරනු ඇත. | වියදම් කළමණාකරණය විධිමත් කළ යුතුවීම. |
| (ආ) | ලෙජරය අනුව 2021 වර්ෂයේ වෙනත් වියදම් වටිනාකම එකතුව රු.226,056,531 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව (ACA ii (i)) එම අගය රු.243,439,341 ක් වූ බැවින් රු.17,382,810ක වෙනසක් නිරීක්ෂණය විය. | වැය ලෙජරය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සසඳා මූල්‍ය ප්‍රකාශන වලට දත්ත ඇතුළත් කර ඇත. | වැය ලෙජරයේ දත්ත නිවැරදිව ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුවීම |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 07 ක වියදම් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 25 සිට සියයට 83 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | වර්ෂය තුළ අදාළ කටයුතු කරගෙන යාමේදී විවිධ හේතූන් මත ඇස්තමේන්තු වල වියදම් සිදුකිරීමට අවශ්‍ය නොවනු ඇත. එවැනි අවස්ථා වලදී එම ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | වියදම් කළමණාකරණය විධිමත් කළ යුතුවීම. |
| (ඈ) | වැය විෂයය අංක 254-1-2-1404 යටතේ බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු සඳහා පරිපූරක ප්‍රතිපාදන ලෙස රු.12,600,000 ක් වෙන්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම පරිපූරක ප්‍රතිපාදනයෙන් සියයට 89 ක් හෙවත් රු.11,192,023 ක් ඉතිරිවී තිබුණි. | නිසි පරිදි බිල්පත් ඉදිරිපත් නොවීම හා ඉදිරිපත් කර තිබූ බිල්පත් වලටද අක්මුදල් ප්‍රමාණවත් නොවීම මත ගෙවීම් කිරීමට නොහැකි වී ඇති බැවින් මෙම තත්ත්වය වාර්තා වී ඇත. | වියදම් කළමණාකරණය විධිමත් කළ යුතුවීම. |
| (ඉ) | ලෙජරය අනුව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීමේ වියදම රු.5,359,938ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම අගය රු.18,834,553 ක් වූ බැවින් රු.13,474,615 ක වෙනසක් නිරීක්ෂණය විය. | ලෙජරය අනුව යන්ත්‍ර උපකරණ අත්පත් කර ගැනීමේ වියදම රු.5,359,938ක් වන අතර, වර්ෂය අවසානයේ භාණ්ඩාගාරය මඟින් මෙම යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේ වැය විෂයන් සඳහා රු.13,474,615ක මුදලක් තැන්පතු ගිණුමට මාරුකර ඇත. | මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි දත්ත ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගමන් වියදම්, ප්‍රවාහන වියදම්, ඉන්ධන, වාහන නඩත්තු හා කුලී ගෙවීම් ආදී වියදම් සඳහා දෙපාර්තමේන්තුවට වෙන් වූ වැය විෂයයන් පැවතුණ ද එම වැය විෂයන්ට අදාල රු.3,434,884 ක් වැය විෂයය අංක 1409 "වෙනත් වියදම්" වල ඇතුළත් කර තිබුණි. | අදාළ වියදම දැරීමේ අත්‍යාවශ්‍යතාවය මත ප්‍රතිපාදන ඇති වෙනත් වැය විෂයකට හර කර ගෙවීම් කරනු ලබන අතර, මු.රෙ. 66 මගින් හෝ අතිරේක ප්‍රතිපාදන ලබාගෙන එමගින් ගැලපීම් කිරීමට පියවර ගනු ඇත | මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදිව වියදම් වර්ගීකරණය කළ යුතුවීම. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------------------ | ----------- |
| (අ) | සලසා තිබුණු ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා එකතුව රු.49,123,684 ක බැරකම්වලට එළඹී තිබුණු අවස්ථාවන් 07 ක් විගණනයේදී නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ අත්‍යාවශ්‍ය රාජකාරී ඉටුකිරීම සඳහා වන වියදම් පියවා ගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් අතිරේක ප්‍රතිපාදන ලබා දීම, පවතින වැය විෂයන් වලින් මු.රෙ. 66 මගින් මාරු කිරීම සහ මු.රෙ.115 යටතේ ගෙවීම් කිරීමට අනුමැතිය යටතේ අදාළ වියදම් දරනු ඇත. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම සිදු නොකළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ බැරකම් වටිනාකම් සහ සිගාස් ගිණුම්කරණ පද්ධතියට ඇතුලත් කර තිබූ බැරකම් වටිනාකම අතර රු.43,570,334 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම් වර්ෂය අවසානයේදී ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇති වවුචර්පත් සිගාස් ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කර ඇති අතර, එදිනට පසුව ලැබුණු බැරකම් ද, මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කර ඇති බැවින් මෙම තත්ත්වය වාර්තා වී ඇත. | මූල්‍ය ප්‍රකාශනයේ ඇති වටිනාකම් භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශ සමඟ සැසඳිය යුතුවීම. |
| (ඇ) | 2022 වර්ෂයට අදාල එකතුව රු.337,419 ක වියදම්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් ලෙස පෙන්වා තිබුණි. | අදාල ගෙවීම සඳහා බිල්පත් ඉදිරිපත් කර ඇති අතර, එම බිල්පත් වල සඳහන් අගය කාල පරිච්ඡේදය නොසළකා මූල්‍ය ප්‍රකාශන වල සඳහන් වීම නිසා මෙම තත්ත්වය වාර්තා වී ඇත. | බැරකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවීම. |
| (ඈ) | රු.200,000 ක බදු කුලී බැරකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ දෙවරක් සටහන් වී තිබුණි. | ගෙවූ බැරකම් සහ නොගෙවූ බැරකම් වශයෙන් වාර්තා දෙකක් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති අතර, රු.200,000 ක බැරකම් එම වාර්තා දෙකටම අතපසුවීමකින් ඇතුළත් වී ඇත. | බැරකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය | | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සියලු ප්‍රාදේශීය කාර්යාල වලින් තොරතුරු කැඳවා අදාළ තොරතුරු මේ වනවිට විශ්ලේෂණය කරමින් පවතින අතර, 2022 ජුනි මස අවසානයට පෙර කෙටුම්පත අනුමැතියට ඉදිරිපත් කරනු ඇත. | යොමුගත පනතට අනුකූල වියයුතුවීම. |
| (ආ) | මුදල් රෙගුලාසි | | | | |
| | (I) මු.රෙ 225 (1) , (4) | | වවුචර් පිළියෙල කිරීමේදී එහි දිනය සඳහන් කර නොතිබුණු අවස්ථා සහ වවුචරය පිළියෙල කරන සහ හරි වැරදි බලන නිලධාරින් එහි කෙටි අත්සන් තබා නොතිබුණු අවස්ථා පැවතුණි. | දෙපාර්තමේන්තුවේ වවුචර්පත් ගණන ප්‍රමාණාත්මක වශයෙන් වැඩි බැවින් මෙම තත්ත්වය වාර්තා වී ඇත. | - එම - |
| | (II) මු.රෙ 1646 | | දෙපාර්තමේන්තුව සතු වාහන 22ක ධාවන සටහන් විගණනය වෙත ලබා දී නොතිබුණු අතර වාහන 17ක මාස 01 සිට මාස 05 දක්වා වූ කාලයක් සඳහා පමණක් ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල වලින් ධාවන සටහන් නිසි පරිදි ගෙන්වා ගැනීමට නොහැකි වී ඇති අතර, 2022 වර්ෂයේදී නියමිත පරිදි සියළුම වාහන වල ධාවන සටහන් ලබාදෙනු ඇත. | යොමුගත රෙගුලාසියට අනුකූල වියයුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 04 ඡේදය | ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක්ද සකස් කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි අනුමැතීන් ලබාගෙන ඇත. | - එම - |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය (I) 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකින් මාස 12කට පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කල යුතු වුවත් දෙපර්තමේන්තුව සතු වාහන 41ක් සඳහා 2021 වර්ෂයේදී ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | කොවිඩ් වාතාවරණය හේතුවෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකිරීමට නොහැකි වී ඇත. 2022 වර්ෂයේදී ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට පියවර ගනු ඇත. | - එම - |
| | (II) 5 ඡේදය | වාහන ලොග් සටහන් පොත්වල දිනපතා සිදුකරන ඉන්ධන භාවිතය හා ධාවනය කරන ලද දුර ප්‍රමාණය ඇතුලත් කර නොතිබුණි. | වාහන වල ලොග් සටහන් පොත් යාවත්කාලීන කිරීම සිදුකරමින් පවතී. | යොමුගත චක්‍රලේඛයට අනුකූල වියයුතුවීම |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අග්‍රිමයක් නිකුත් කර අදාල කාර්යය අවසන් කර දින 10ක් තුළ නැවත අග්‍රිමය පියවීම සිදුවිය යුතු වුවද ඒ සඳහා පියවීමේ ප්‍රමාද කාලය දින 3 සිට දින 89 දක්වා විහිදී තිබුණු අවස්ථා 7ක් විගණනයේදී නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ කාර්යයන් නියමිත වේලාවට ඉටු කරගැනීමට නොහැකි වීම හා අදාළ වවුචර්පත් තැපැල් මඟින් ඉදිරිපත් කිරීමේදී සිදුවූ ප්‍රමාද වීම් නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. | අග්‍රිම කළමණාකරණය විධිමත් කළ යුතුවීම. |
| (ආ) | යථෝක්ත චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව මධ්‍යම ලේඛනාගාරයේ අළුත්වැඩියා කටයුතු සඳහා නිලධාරියෙකු වෙත රු.150,000 ක අත්තිකාරමක් ලබා දී තිබුණි. | අදාළ සීමාව ඉක්මවා අත්තිකාරම් ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම, අතපසුවීමක් හේතුවෙන් නොහැකි වී ඇත. | අත්තිකාරම් පාලනය විධිමත් කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසර 01 සිට වසර 30 දක්වා කාලපරාසයක් තුළ මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය අතහැර ගිය සහ සේවයෙන් පහකළ නිළධාරීන් 48 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,735,515ක් 2021 දෙසැම්බර් 31 දක්වා අයකරගෙන නොතිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | කාර්යක්ෂමව ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කිරීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 සැලැසුම් කිරීම**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරි සැලැස්ම හා එහි ප්‍රගතිය පිලිබඳ වාර්තාවේ අන්තර්ගත කරුණු සමගාමීව හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | ආයතනික සැළසුම් හා එහි ප්‍රගතිය සම්බන්ධ වාර්තා විධිමත්ව සකස් කළ යුතුවීම. |
| (ආ) | ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කර තිබූ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය වර්ෂය අවසානයේ ලබා දුන් ප්‍රගති වාර්තාවේ ඇතුලත් කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | -එම- |

**3.2 ප්‍රසම්පාදනයන්**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ ඡායා පිටපත් ලබා ගැනීමේ සේවා ගිවිසුම (රු.මිලියන 63) 2021 මැයි මාසයේ අවසන් වූ අතර නව සැපයුම්කරුවකු තෝරා ගැනිම සඳහා ලංසු ඇගයීම් දිනයන් අවස්ථා 3කදී වෙනස් කරමින් පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් පිලිවෙලින් රු.88,020 ක්, රු.33,696 ක් හා රු.63,720 ක් බැගින් වියදම් කර තිබුණි. | නොවැළැක්විය හැකි හේතුන් නිසා ලංසු විවෘත කිරීමේ දින දීර්ඝ කර ඇති අතර, පුවත්පත් දැන්වීම් පල කර ලංසු කැඳවා ඇති බැවින් දින දීර්ඝ කිරීමේ දී පුවත්පත් මගින් දැනුම් දීමට සිදු වී ඇත. | වියදම් පාලනය විධිමත් කළ යුතුවීම. |
| (ආ) | ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා සහ ශාඛා කාර්යාලවලට බෙදා හැරීම සඳහා ලිපිකරු පුටු 150 ක් සහ ලිපිකරු මේස 75 ක් මිලදී ගැනීමේදී රු. 3,367,980 ක් වටිනා ප්‍රසම්පාදනය සඳහා දින 14 ක් ඇතුලත ලබාගත යුතු කාර්ය සාධන සුරක්ෂණය දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 "ආ" ප්‍රකාරව විධිමත් ගිවිසුමක්ද අත්සන් කර නොතිබුණි. | මෙම ප්‍රසම්පාදනයට අදාලව කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගෙන නොමැති අතර ඉදිරියේ දී අදාළ අඩුපාඩුව නිවැරදි කර ගැනීමට හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන කාර්යයන් විධිමත් කළ යුතුවීම. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10 "ආ" ප්‍රකාරව ලංසුවල වලංගු කාලය තුල ලංසු ඇගයීමට හා අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කල යුතු වුවද යථෝක්ත ප්‍රසම්පාදනයට අදාලව පෙර ප්‍රසම්පාදන කටයුතු ලංසු සුරක්ෂණයේ කාලය තුල අවසන් කර ගැනීමට නොහැකි වී තිබුණු අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.5.1 ප්‍රකාරව ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝ කර ගැනිම ද සිදුකර නොතිබුණි. | කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා ලංසුවල වලංගු කාලය තුළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අපොහොසත් වී ඇත. | ප්‍රසම්පාදන කාර්යයන් විධිමත් කළ යුතුවීම |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (ii) හා (iv) ප්‍රකාරව පිරිවිතර හා ලංසු කැඳවීමේ ලේඛන සමාලෝචනය කොට අනුමත කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුවල | සුළු ප්‍රසම්පාදන කටයුතු වලදී තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ලංසු කැඳවීමේ ලේඛන සමාලෝචනය කොට අනුමත කර නැත. | ප්‍රසම්පාදන කාර්යයන් විධිමත් කළ යුතුවීම |

| | | | |
|---|---|---|---|
| | කාර්යභාර්යක් වුවද 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් සිදුකල ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම කාර්යභාරය ඉටුකර නොතිබුණි. | | |
| (ඉ) | පෞද්ගලික ආයතනයකින් මුද්‍රණ යන්ත්‍ර 26 ක් මිලදී ගැනීමේදී වලංගු කාලය ඉක්මවීමෙන් පසුව ලංසු ප්‍රදානය කර තිබුණු බැවින් ඉදිරිපත් කල මිල ගණන් වලට මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම කාලය තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා කාර්යාල නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම නිසා ලංසු ප්‍රදානය ප්‍රමාද වී ඇත. පසුව පැනනැගුණු වෙළඳපල මිල උච්ඡාවචනය හේතුවෙන් ප්‍රදානයකළ මිලට ලබා දිය නොහැකි බව අදාළ ආයතනය විසින් දැනුම් දී ඇත. | ප්‍රසම්පාදන කාර්යයන් විධිමත් කළ යුතුවීම. |

**3.3 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් හි වත්කම් කාණ්ඩ 09 ක අවසාන ශේෂය හා 2021 වර්ෂයේ ආරම්භක ශේෂය අතර එකතුව රු.1,682,845,980 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර 2020 වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනයන්හි ඉඩම් වල ශේෂයක් පෙන්නුම් කර නොතිබුනද 2021 වර්ෂය ආරම්භයේදී ඉඩම් ශේෂය රු.1,558,895,000 ක් විය. | 2020 වර්ෂයේ CIGAS වැඩසටහනට ඇතුලත් කළ සැපයුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ආරම්භක ශේෂ වල වෙනසක් පැවති බැවින් ආරම්භක ශේෂ වශයෙන් ඇතුලත් කර නොමැති තොරතුරු නැවත ආරම්භක ශේෂ වශයෙන් ඇතුලත් කිරීමට පියවර ගත යුතු අතර එම කාර්යය මෙතෙක් ඉටුකර ගැනීමට නොහැකි වී ඇත. | වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කල යුතු වීම. |
| (ආ) | 2018, 2019 හා 2020 වර්ෂයේදී ධාවනයෙන් ඉවත්කර තිබූ වාහන 6 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අළුත්වැඩියා කර ධාවනයට යෙදවීමට හෝ වෙනත් විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකිවී තිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සහ ප්‍රතිපාදන නොමැති වීම මත අදාල වාහන 2021 වර්ෂය අවසානය දක්වා අළුත්වැඩියා කර ධාවනයට යෙදවීමට නොහැකි වූ අතර, ආර්ථික අර්බුදය හේතුවෙන් එම වාහන අළුත්වැඩියා කිරීමට නොහැකි වී ඇත, | වත්කම් කළමණාකරනය විධිමත් කල යුතු වීම |

### 3.4 අනාර්ථික ගනුදෙණු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.55,637 ක අධිභාර ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදි ප්‍රමාදයකින් තොරව විදුලි බිල්පත් ගෙවීමටත් පොලිය සම්බන්ධයෙන් අදාල ආයතනය සමඟ සාකච්ජා කර පොලිය ඉවත් කරවා ගැනීමටත් පියවර ගනු ඇත. | කාර්යක්ෂමව හා ඵලදායීව රාජ්‍ය වියදම් කලමානාකරණය කිරීම. |

### 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2812 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 3229ක් වූ බැවින් අතිරික්ත හා ඌන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 670 ක් හා 252ක් විය. මුළු අතිරික්ත කාර්ය මණ්ඩලයම සංවර්ධන නිළධාරීන් වන අතර ඌන කාර්ය මණ්ඩලය ප්‍රධාන තනතුරු 06 ක් ඇතුළත් වූ තනතුරු 17 කින් සමන්විත විය. | අතිරික්ත සේවක සංඛ්‍යාව තුළ ඇතුළත් සංවර්ධන නිළධාරී තනතුරු සංඛ්‍යාව අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත. ඌන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ අවශ්‍යතාවය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දන්වා ඇත. | මානව සම්පත් කළමණාකරනය විධිමත්ව කල යුතු වීම |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරිගේ ස්ථිර පත්වීමක් සිදු කිරීම 2021 වර්ෂයේ මාස කිහිපයකට පමණක් සීමා වී තිබුණු අතර වසර 4කට වැඩි කාලයක් තිස්සේ වැඩ බලන හා රාජකාරී ආවරණය කරන පදනමින් ඒ සඳහා නිලධාරීන් පත්කර තිබුණි. එම එක් එක් නිලධාරීන්ගේ සේවා කාලය මාස 01, මාස 03 ලෙස වරින් වර වෙනස්වූ අවස්ථා ද විගණනයේදී නිරීක්ෂණය වූ අතර ගණන්දීමේ නිළධාරි සඳහා ස්ථිර පත්වීමක් මෙම වාර්තාවේ දින දක්වාම සිදුකර නොතිබුණි. | ගණන්දීමේ නිලධාරි සඳහා ස්ථිර පත්වීමක් මේ වනවිටද සිදු කර නොමැත. | -එම- |